සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- නිවැරදි හා වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අදින්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.

---

01. අන්තර් පුද්ගල සන්නිවේදනයේ අරමුණු අතරට නොඑන්නේ,
(1) තොරතුරු දැන ගැනීම (2) උපදේශනය
(3) මඟ පෙන්වීම (4) සබඳතා ශක්තිමත් කර ගැනීම
(5) රැස්වීම් පැවැත්වීම

02. සමූහ සන්නිවේදනයේ කණ්ඩායම් පහ යටතට අයත් නොවන්නේ,
(1) ඉගෙනුම් කණ්ඩායම් (2) ක්‍රීඩා කණ්ඩායම්
(3) විශෝධන කණ්ඩායම් (4) ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම්
(5) අහඹු කණ්ඩායම්

03. දුරකථනය යොදා ගත හැකි සන්නිවේදන ප්‍රභේදය වන්නේ,
(1) පුද්ගලාන්තර සන්නිවේදනය (2) ජන සන්නිවේදනය
(3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (4) සමූහ සන්නිවේදනය
(5) විශ්ව සන්නිවේදනය

04 සන්නිවේදන ක්‍රියාවලියක දී එහි සැබෑ හැඩ රුව තේරුම් ගැනීමට වඩාත් වැදගත්වන මූලිකාංගය නම්,
(1) සන්නිවේදකයා (2) ග්‍රාහකයා (3) නාලිකාව
(4) කන්දර්භය (5) ශබ්ද මූලය

05. අත්දැකීම් ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කරමින් ආකෘතියක් ඉදිරිපත් කළ සන්නිවේදන විශාරදයා වන්නේ,
(1) විල්බර් ශ්‍රාම් (2) ඬේවිඩ් කේ. බර්ලෝ (3) ශැනොන් වීවර්
(4) ඇරිස්ටෝටල් (5) හැරල්ඩ් ඩී ලැස්වෙල්

06. අවිධිමත් සන්නිවේදන ක්‍රියාදාමයන් අතරට නො ගැනෙන්නේ,
(1) ඕපාදූප දාමය (2) සම්භාවිතා දාමය (3) පර්ෂද දාමය
(4) තනි දාමය (5) ඍජු දාමය

07. සන්නිවේදන ඉතිහාසයේ කඩඉමක් ලෙස සැලකෙන්නේ
(1) රූපවාහිනිය සොයා ගැනීම (2) ගෝලීයකරණය සිදුවීම
(3) නව මාධ්‍ය ප්‍රචලිත වීම (4) සමාජ ජාල වෙබ් අඩවි සැකසීම
(5) මුද්‍රණ ශිල්පය සොයා ගැනීම.

08. නව මාධ්‍ය ලෙස හඳුනාගත හැක්කේ
(1) සිනමාව හා අන්තර්ජාලය (2) ජංගම දුරකථන හා අන්තර්ජාලය
(3) ගුවන් විදුලිය හා රූපවාහිනිය (4) දුරකථනය හා ඡායාරූප
(5) පුවත්පත් හා සඟරා

09. පෝස්ටරය යනු
(1)විධිමත් මාධ්‍යයකි. (2) නව මාධ්‍යයකි.
(3) ලිඛිත මාධ්‍යයකි. (4) දෘශ්‍ය මාධ්‍යයකි.
(5) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.

10. ''තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණ කොට ගනිමින් දෙපාර්ශවයක් අතර එක සමාන මනෝභාවයක් ඇති කිරීම සන්නිවේදනයයි.'' මෙය නිර්වචනය කළේ,

(1) ශැනොන් වීවර් (2) විල්බර් ශ්‍රාම් (3) හැරල්ඩ් ඩී. ලැස්වෙල්

(4) එඩ්වඩ් ෂැපීර් (5) මාෂල් මැක්ලුහන්

11. ඩේවිඩ් කේ. බර්ලෝ විසින් ඉදිරිපත් කළ ආකෘතිය වන්නේ,

(1) S.M.C.Rආකෘතිය (2) දෙපියවර ආකෘතිය (3) දොරටුපාල ආකෘතිය

(4) සම්ප්‍රදායික ආකෘතිය (5) ගණිතමය ආකෘතිය

12. බාහිර උපකරණ භාවිතයට නොගන්නා සන්නිවේදන වර්ගය වන්නේ

(1)අන්තර්වර්තී සන්නිවේදනය (2) සමූහ සන්නිවේදනය

(3) නිර්වාචික සන්නිවේදනය (4) ජන සන්නිවේදනය

(5) පුද්ගලාන්තර සන්නවේදනය

13. අධිපති දෘෂ්ඨිකෝණයෙන් තොරව වාර්තාකරණයේ යෙදෙන්නේ,

(1) විකල්ප මාධ්‍ය කරණයේදී ය. (2) නව මාධ්‍ය භාවිතයේදී ය.

(3) නූතන මාධ්‍ය භාවිතයේදී ය. (4) පුරවැසි මාධ්‍ය කරණයේදී ය.

(5) රජයේ මාධ්‍ය භාවිතයේදී ය.

14. ගුරුතුමා ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ කරුණු කිහිපයක් ශිෂ්‍යයා විසින් අවබෝධ කර ගැනීමට ගන්නා උත්සහයේදී සිදුවන්නේ,

(1) ආකේතිකරණය (2) සංජානනය (3) විකේතිකරණය

(4) පරිවර්තනය (5) උපදේශනය

15. අර්ථ බාධකවලට වඩාත් ම හේතු විය හැකි සාධකය වන්නේ,

(1) පණිවිඩ සම්ප්‍රේෂණය (2) සංකේත තෝරා ගැනීම (3) ග්‍රාහක දුර්වලතා

(4) තාක්ෂණික අක්‍රමිකතා (5) නාලිකා භාවිතයේ ස්වභාවය

16. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය පිළිබඳව නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

(1) ලාභ ලැබීම ප්‍රධාන පර්මාර්ථය වේ.

(2) මහා පරිමාණයෙන් මාධ්‍ය ව්‍යාප්තව නොපවතියි.

(3) මතවාදී කර්තව්‍යයක් ඉටු කරයි.

(4) ග්‍රාහක පිරිස කුඩාය

(5) ප්‍රධාන මාධ්‍ය ධාරාවට පරිබාහිරව ක්‍රියාත්මක වේ.

17. ආත්ම භාෂණය මුලික කරගත් සන්නිවේදන වර්ගීකරණය වන්නේ.

(1) ජන සන්නිවේදනය (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

(3) සමූහ සන්නිවේදනය (4) කුඩා කණ්ඩායම් සන්නිවේදනය

(5) පුද්ගලාන්තර සන්නිවේදනය

18. ජන සන්නිවේදනයට අදාළ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) බහු විධ ග්‍රාහකයන් සම්බන්ධ වේ. (2) කාලය හා අවකාශය ජය නොගනී.

(3) මාධ්‍යකරුවන් අවශ්‍ය වේ. (4) විවිධ භාෂා භාවිතා කළ හැකිය.

(5) තාක්ෂණික උපකරණ භාවිතය අත්‍යාවශ්‍ය වේ.

19. දැන්වීම්, පෝස්ටර්, රූප සටහන් අයත් වන්නේ,

(1) ලිඛිත සන්නිවේදනයට (2) චිත්‍රක සන්නිවේදනයට (3) දෘශ්‍ය සන්නිවේදනයට

(4) නිර්වාචික සන්නිවේදනයට (5) දෘශ්‍ය හා ලිඛිත සන්නිවේදනයට

20. එකම පවුලක සාමාජිකයන් සියලුම දෙනා කපා කොටා අමානුෂික ලෙස පරා දැමීමේ පුවතක් පුවත්පතේ පළ වී තිබුණි. මෙම පුවත,

(1) කාලීන පුවතකි. (2) මුද්‍රා පුවතකි. (3) දෘඪ පුවතකි

(4) කල්පිත පුවතකි. (5) සංක්ෂිප්ත පුවතකි.

21. කඩදාසි සොයා ගත්තේ,

(1) ජර්මන් ජාතිකයින් (2) චීන ජාතිකයින් (3) රතු ඉන්දියානුවන්

(4) යුරෝපා ජාතිකයින් (5) ග්‍රීක වැසියන්

22. සන්නිවේදන ආකෘති ආශ්‍රිත ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ ඛාණ්ඩය ඇතුලත් පිළිතුර තෝරන්න.

A ලැස්වෙල් ආකෘතියේ මූලිකාංග 5ක් ඇත.

B බර්ලෝ ආකෘතියේ සන්නිවේදක හා ග්‍රාහක භූමිකා සමානය.

C ශැනොන් විවර් ආකෘතියේ ශබ්දමූලය විශේෂිත වේ.

(1) A B C යන සියල්ලම නිවැරදිය. (2) A පමණක් නිවැරදිය.

(3) B වැරදිය. (4) A හා C පමණක් නිවැරදිය.

(5) A B C සියල්ලම වැරදිය

23. සම්ප්‍රදායික චර්යා , ආගමික සංස්ථා හා පවුල යනාදිය

(1) සන්නිවේදන නියාමනයන් ය. (2) දේශපාලන සංවිධාන ය.

(3) සමාජානුයෝජන කාරක ය. (4) සමාජ සන්ධිස්ථාන ය.

(5) සාමාජීය අවයව ය.

24. සමාජ පන්ති නිර්මාණය වන්නේ,

(1) පරම්පරාව මත (2) දේශපාලන බලපෑම මත (3) පාරිසරික සාධක මත

(4) ගති පැවතුම්පත (5) සම්පත් හිමිකම මත

25 දේශනය අවසානයේදී ගැටලු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලැබුණි. මෙම අවස්ථාවේදී සිදුවන්නේ,

(1) උත්තේජනය (2) විකේතකරණය (3) ආකේතකරණය

(4) ප්‍රතිපෝෂණය (5) සෝෂණය

26 රටක ජනමාධ්‍යවේදින් එම රටේ සංස්කෘතියට හා හර පද්ධතියට අදාළ ආකාරයෙන් මෙන්ම වගකීමෙන් යුතුව ද මාධ්‍ය මෙහෙයවයි. මෙයට අදාළ සන්නිවේදන සංකල්පය වන්නේ,

(1) අධිපතිවාදි සන්නිවේදන සංකල්පය. (2) නිදහස් මතවාද සන්නිවේදන සංකල්පය.

(3) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය. (4) විප්ලවවාදී සන්නිවේදන සංකල්පය.

(5) සංවර්ධන සන්නිවේදන සංකල්පය.

27 ආරම්භක යුගයේ දී සන්නිවේදනය සඳහා යොදා ගත්තේ,

(1) ගින්දර, වර්ණ හා ක්‍රම (2) සංඥා, සංකේත හා ඉඟි

(3) අණ බෙර, හඬ හා ඉඟි (4) සටහන්, ගින්දර හා හඬ

(5) වර්ණ, භාෂාව හා අණබෙර

28 අධිපතිවාදි සංකල්පයේදී මාධ්‍ය පාලනය කිරීම සඳහා යොදගන්නා උපක්‍රමයක් නොවන්නේ,

(1) බලපත්‍ර ක්‍රමය (2) වාරණය (3) දඬුවම් පැණවීම

(4) රජය මැදිහත්වීම (5) නිදහසේ ගලා යෑමට ඉඩ හැරීම.

29 පහත දැක්වෙන ලේඛන ක්‍රම අතර පැරණිම ලේඛන ක්‍රමය වන්නේ,

(1) ලෑලි පුවරු මත ලිවීම. (2) රෙදි මත ලිවීම.

(3) ගල් පුවරු මත ලිවීම. (4) ගස්වල පට්ටා මත ලිවීම

(5) තෙත මැටි පුවරු මත ලිවීම.

30 අවාචික සන්නිවේදනයට අයත් නොවන්නේ,

(1) ඇස් සම්බන්ධතා (2) මුහුණේ ඉරියව් (3) ස්පර්ශය

(4) ඇඳුම් පැළඳුම් (5) ලිපි

31 සමාජය හා සම්බන්ධ මතයක් නොවන්නේ,

(1) සමාජය විකාශනය වීම මිනිස් අවශ්‍යතා මත සිදුවිය.

(2) සන්නිවේදනය මෙහිදී ප්‍රබල සාධකයක් විය.

(3) සමාජය ගතිකත්වයකින් තොරය.

(4) මිනිසාගේ සාමූහික හැසිරීම් මත සමාජය ගොඩනැගුනකි.

(5) තාක්ෂණයේ දියුණුවත් සමග සමාජයේ අදහස් ප්‍රකාශනය අධිවේගී විය.

32 උද්ගාමී හා නිගාමී තර්ක ක්‍රම යොදා ගත්තේ,

(1) ඥාණ ගවේෂණයේ දී. (2) සන්නිවේදන නියාමනයේ දී.

(3) සහභාගිත්ව සන්නිවේදනයේ දී. (4) නව මාධ්‍ය භාවිතයේ දී .

(5) දැනුම් සමාජය ගොඩනැගීමේදී.

33. විශ්ව ගම්මාන සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ,

(1) සායිලුන් විසින් (2) මාෂල් මැක්ලුහන් විසින් (3) විල්බර් ශ්‍රාම් විසින්

(4) ඩැනියල් ලර්නර් විසින් (5) හැරල්ඩ් ලැස්වේල් විසින්

34 සන්නිවේදනය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

(1) සන්නිවේදනයට මූලික අරමුණක් වේ.

(2) ග්‍රාහකයකු නොවන තැන සන්නිවේදනයක් නැත.

(3) සන්නිවේදනය සඳහා යොදා ගන්නා සංකේත පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

(4) ග්‍රාහක හා සන්නිවේදන භූමිකා ස්ථාවරව පැවතීම අවශ්‍යය.

(5) සන්නිවේදන ක්‍රියාවලිය අවශ්‍යතාවය අනුව ඒකමාර්ගික ද විය හැක.

35 සන්නිවේදනයේ කාර්යයක් නොවන්නේ,

(1) තොරතුරු සම්පාදනය (2) අධ්‍යාපනය (3) පෙළඹවීම

(4) විනෝදාශ්වාදය (5) තාක්ෂණික දියුණුව

36 මාධ්‍ය ආයතන මගින් සංශෝධනය කළ පුවත් ග්‍රාහක ගත කිරීමේ ක්‍රියාවලියට අදාළ සංකල්පය වන්නේ

(1) අධිපති සංකල්පය (2) දොරටුපාල සංකල්පය

(3) නිදහස් මතවාදි සංකල්පය (4) සංවර්ධන සංකල්පය

(5) දෙපියවර සංකල්පය

The National e-learning Portal for The General Education

37 රේඛීය ආකෘතියක් ලෙස නොසැලකිය හැක්කේ,

(1) ලැස්වෙල් ආකෘතිය (2) ඇරිස්ටෝටල් ආකෘතිය

(3) දොරටුපාල ආකෘතිය (4) ශ්‍රාම් බස්ගුඩ් ආකෘතිය

(5) බර්ලෝ ආකෘතිය

(38) හදිසි ව්‍යවසනයක් පිළිබඳව ඉතා ඉක්මනින් ජනතාව දැනුවත් කළ හැක්කේ,

(1) පුවත්පත් මගින් (2) ජංගම දුරකථන මගින්

(3) ගුවන් විදුලිය මගින් (4) අන්තර්ජාලය මගින්

(5) රූපවාහිනිය මගින්

(39) බන්ධනාගාර ගතවූවන්, මානසික විකෘතිතා සහිත අය අයත්වන්නේ,

(1) අහඹු කණ්ඩායම් (2) විශෝධන කණ්ඩායම්

(3) උප සංස්කෘතික කණ්ඩායම් (4) ඉගෙනුම් කණ්ඩායම්

(5) බැහැර කණ්ඩායම්

(40) සාම්ප්‍රදායික සමාජයන් හි සංස්කෘතිය හැඩගැස්වීමෙහිලා දැඩි බලපෑමක් නොකරන ලද්දේ,

(1) සඟරා (2) වැඩිහිටියෝ (3) ආගම

(4) අධ්‍යාපනය (5) සමාජ සබඳතා

(41) '' ගිය නුවණ ඇතුන් ලවා වත් ඇදිය නොහැකිය.'' මෙම කියමනට වඩාත් සමීප සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) ලිඛිත සන්නිවේදනය (2) වාචික සන්නිවේදනය (3) ශ්‍රව්‍ය සන්නිවේදනය

(4) දෘශ්‍ය සන්නිවේදනය (5) අවිධිමත් සන්නිවේදනය

(42) නව සන්නිවේදන නියාමන ආයතනයක් ලෙස සැලකිය නොහැක්කේ

(1) විදුලි සංදේශන නියාමන කොමිෂම

(2) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

(3) පුවත්පත් පැමිණිලි කොමිසම

(4) පුවත්පත් මණ්ඩලය

(5) සෞඛ්‍ය අධ්‍යාපන කාර්යංශය

(43) බාහිර සාධකවල බලපෑම් මූලික කරගෙන ඇතිවන සන්නිවේදන සාධකයක් වන්නේ,

(1) අර්ෂ බාධක (2) මාධ්‍ය බාධක

(3) පාරිසරික බාධක (4) ශ්‍රවණ බාධක

(5) යාන්ත්‍රික බාධක

(44) වාචික සන්නිවේදනය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) මනා භාෂා ප්‍රවීණත්වයක් වාචික සන්නිවේදනය වැදගත් ය.

(2) අවාචික සන්නිවේදනය තුළින් පෝෂණය වේ.

(3) ග්‍රාහකයා හා සන්නිවේදකයා පොදු භාෂාවක් දැන සිටිය යුතු ය.

(4) නිරවුල් උච්චාරණය වැදගත් ය.

(5) නියමිත වේගයකින් හා අසන්නාට පැහැදිලිවන අයුරින් කතා කිරීම සාර්ථක වාචික සන්නිවේදනයට රුකුලකි.

(45) අන්තර් පුද්ගල සන්නිවේදයේ දී,

(1) මුහුණට මුහුණලා කරන සන්නිවේදනයකි.
(2) නව තාක්ෂණය නිසා ස්වරූපය වෙනස්වීමට ඉඩ ඇත.
(3) ඒක පාර්ශ්වික වේ.
(4) භූමිකා හුවමාරුවක් සිදු නොවේ.
(5) නව මාධ්‍ය භාවිතා කළ නොහැක.

(46) ඥාති සබඳතා , මිත්‍රත්වය ආදී සමාජ සන්සිද්ධීන්

(1) සංජානනය මත පදනම් වේ.
(2) ප්‍රතිෂ්ඨාපනය මත පදනම් වේ.
(3) සමාජ සබඳතා මත පදනම් වේ.
(4) නියාමනය මත පදනම් වේ.
(5) සන්නිවේදනය මත පදනම් වේ.

(47) සෝවියට් කොමියුනිස්ට සංකල්පය වනාහි,

(1) සංවර්ධන සන්නිවේදන සංකල්පයේ දිගුවකි.
(2) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයේ දිගුවකි.
(3) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ දිගුවකි.
(4) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පයේ දිගුවකි.
(5) ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පයේ දිගුවකි.

(48) කිසියම් පරමාදර්ශී චරිතයක ගුණාංග තමන්ට ආරෝපණය කර ගැනීම.

(1) ආත්ම භාෂණයයි (2) තදාත්මීය කරණයයි (3) අනුකරණයයි
(4) පරමාදර්ශයයි (5) අනුකලනයයි

(49) ස්වදේශීය චින්තනය තොඩ නැඟී ඇත්තේ

(1) සංස්කෘතිය මත
(2) ජනමත නායකයින්ගේ චින්තනය මත
(3) ආගමික සංකල්ප මත
(4) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය මත
(5) කලාව හා දේශපාලනය මත

(50) ප්‍රමාද වූ ප්‍රතිපෝෂණය වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ

(1) කුඩා කණ්ඩායම් සන්නිවේදනයේ දී (2) ජන සන්නිවේදනයේ දී
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී (4) සමූහ සන්නිවේදනයේ දී
(5) නිර්වාචික සන්නිවේදනයේ දී.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **තෝරාගත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමිවේ.**

---

01 (1) සන්නිවේදන ස්වරූප 4ක් නම් කරන්න. (ලං 02)
(2) එයින් කැමති දෙකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලං 04)
(3) අධිපතිවාදී සන්නිවේදන සංකල්පය පහදා එහි ලක්ෂණ 4ක් සරලව විස්තර කරන්න. (ලං 06)
(4) පිළිගත් නිර්වචනයක් ආශ්‍රයෙන් සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතාවය පහදන්න. (ලං 08)

02 තාක්ෂණයේ සංවර්ධනය හේතුවෙන් සන්නිවේදනය දියුණු තත්වයකට පැමිණ ඇත. ගෝලීයකරණ සංකල්පය එසේ දියුණුවත් සමඟ ලොව පුරා ව්‍යාප්ත වූවකි.
(1) ගෝලීයකරණය යනු කුමක්ද? සරලව පහදන්න. (ලං 02)
(2) ගෝලීයකරණයේ ලක්ෂණ 4ක් නම් කරන්න. (ලං 04)
(3) ගෝලීයකරණයේ නව ප්‍රවණතා 3ක් සරලව විස්තර කරන්න. (ලං 06)
(4) ගෝලීයකරණය සමාජය මත ඇති කරන බලපෑම පිළිබඳව නිදසුන් සහිතව පහදන්න. (ලං 08)

03 (1) සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය ඉදිරිපත් කළේ කවුද? (ලං 02)
(2) එහි සියලු මූලිකාංග ඇතුව ආකෘතිය ඇඳ දක්වන්න. (ලං 04)
(3) මෙම ආකෘතියේ කැපී පෙනෙන මූලිකාංගය නම් කර එහි ප්‍රභේද දෙක විස්තර කරන්න. (ලං 06)
(4) සන්නිවේදන ක්‍රියාවලියට ප්‍රතිපෝෂණය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලං 08)

04 (1) සමාජානුයෝජනය යනු කුමක්දැයි සඳහන් කරන්න. (ලං 03)
(2) සමාජානුයෝජනය වන ආකාර තුන දක්වන්න. (ලං 03)
(3) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය කෙටියෙන් හඳුන්වන්න. (ලං 06)
(4) පුරවැසි මාධ්‍යකරණය නිදසුන් සහිතව විස්තර කරන්න. (ලං 08)

05 (1) ප්‍රාථමික සන්නිවේදන ක්‍රම 4ක් නම් කරන්න. (ලං 02)
(2) සන්නිවේදන මාධ්‍ය අතර නූතන මාධ්‍ය යනු මොනවාදැයි නම් කරන්න. (ලං 04)
(3) සමූහ සන්නිවේදනය යනු කුමක්දැයි ඊට අදාළ ලක්ෂණ සහිතව සරලව පහදන්න. (ලං 06)
(4) සන්නිවේදනය අතීතයේ සිට විකාශනය වූ ආකාරය විස්තර කරන්න. (ලං 08)

06 (1) සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න. (ලං 02)
(2) ඔහු ඉදිරිපත් කළ ආකෘතිය ඇඳ දක්වන්න. (ලං 04)
(3) එම ආකෘතියේ ඔබ හඳුනාගත් දුර්වලතාවය විස්තර කරන්න. (ලං 06)
(4) ආකෘතියේ අවස්ථා එකින් එක ගෙන විස්තර කරන්න. (ලං 08)

07 (1) සන්නිවේදන වර්ග 4ක් නම් කරන්න. (ලං 02)
(2) තමා තුළ සිදුවන සන්නිවේදනය පිළිබඳව එහි ලක්ෂණ 2ක් දක්වා සරලව විස්තර කරන්න. (ලං 04)
(3) ජන සන්නිවේදනය පිළිබඳව සරලව පහදන්න. (ලං 06)
(4) ජන සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය අතර වෙනස සාකච්ඡා කරන්න. (ලං 08)